# දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIIM)

# කොළඹ විශ්වවිද්‍යාලය

## අධ්‍යක්ෂ ධුරය සඳහා අයදුම්පත් කැඳවීම

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සහ එහි පසුකාලීන සංශෝධන, 2017 අංක 05 දරන PGIIM ආඥාපනත සහ එහි පසු කාලීන සංශෝධන මෙන්ම 2024 ජනවාරි 01 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 01/ 2024 දරන චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව, කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ (PGIIM) අධ්‍යක්ෂ ධුරය සඳහා දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් වෛද්‍ය හෝ දේශීය වෛද්‍ය විෂය ක්ෂේත්‍රයක මණ්ඩල සහතිකකරණය ( Board Certification) සහිත වෛද්‍ය විද්‍යාපති/ ශල්‍ය වෛද්‍ය විද්‍යාපති (MD/MS) හෝ ඊට සමාන සුදුසුකමක් හෝ ආචාර්ය උපාධියක් (PhD හෝ ඊට සමාන) වෛද්‍ය හෝ දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයට අදාළව සපුරා තිබිය යුතුය. ආචාර්ය උපාධි සුදුසුකම් ලැබීමෙන් පසු වසර පහක (05) පරිපාලන පළපුරුද්දක් තිබිය යුතුය. අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු අතර, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 63 ට අඩු විය යුතුය. තවද, PGIIM ආඥාපනතෙහි සඳහන් කාර්යයන් සහ වගකීම් ඉටු කිරීමට සහ නව අධ්‍යක්ෂවරයා ලෙස නායකත්වය සැපයීමට සුදුසු පළපුරුද්දක් තිබිය යුතුය. අධ්‍යාපනික හා පරිපාලන ක්ෂේත්‍රයන්හි පූර්ව පළපුරුද්ද අමතර සුදුසුකමක් වනු ඇත. PGIIM අධ්‍යක්ෂවරයා ආයතනයේ පූර්ණකාලීන නිලධාරියෙකු විය යුතු අතර, ඔහු /ඇය PGIIM හි ප්‍රධාන විධායක නිලධාරියා, ප්‍රධාන අධ්‍යයන නිලධාරියා සහ ගණන් දීමේ නිලධාරියා වේ. නිල කාලය වසර තුනකි. ඔහු /ඇය නිල බලයෙන් PGIIM කළමනාකරණ මණ්ඩලයේ සහ එහි සියලුම අධ්‍යයන මණ්ඩලවල සාමාජිකයෙකු වේ. **අයදුම්පත සමග පහත සඳහන් ලේඛන ද ඉදිරිපත් කළ යුතුය.**

1. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත (PGIIM වෙබ් අඩවියෙන් බාගත හැකිය)
2. ආයතනයේ සංවර්ධනය උදෙසා වන ඉදිරි දැක්ම පිළිබඳ ප්‍රකාශයක්
3. අධ්‍යක්ෂ ධුරයට පත් වුවහොත්, අයදුම්කරු ළඟා කර ගැනීමට අපේක්ෂා කරන ඉලක්ක පිළිබඳ කෙටි විස්තරයක්
4. තම උපන් දිනය (සහතික කළ උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා තිබිය යුතුය) සහ ඇමතුම් අංක සමග සම්පූර්ණ ජීවදත්ත (සහයක ලේඛන සහිතව) ඇතුළත් අයදුම්පතක්
5. දැනට ධුරය දරන අධ්‍යක්ෂවරයාම අයදුම් කරන්නේ නම් හෝ මීට පෙර ආයතනයේ අධ්‍යක්ෂ ධුරය දරා ඇත්නම්, ඔහුගේ /ඇයගේ පළමු ධුර කාලය තුළ ලබාගත් ජයග්‍රහණ සහ ප්‍රගතිය පිළිබඳ වාර්තාවක්,
6. දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIIM) හැර වෙනත් රාජ්‍ය අංශයේ, සංස්ථාවල, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සහ උසස් අධ්‍යාපන ආයතන වල දැනට සේවය කරන අයදුම් කරුවෙකු නම්, මෙම තනතුරට පත්වුවහොත් තමන්ව සේවයෙන් මුදා හැරිය හැකිද යන්න සඳහන් කරමින් සේවායෝජකයාගෙන් ලබාගත් ලිපියක්.

තේරීම් ක්‍රියාවලිය 2024 ජනවාරි 01 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2024 හි දක්වා ඇති උපදෙස් පරිදි සිදු කරනු ලැබේ.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/ 2024 සහ PGIIM ආඥාපනත, පිළිවෙලින් UGC සහ PGIIM වෙබ් අඩවි වලින් බාගත හැකිය.

අයදුම්පත් මුදු තැබූ කවරයක බහා **"ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කොළඹ විශ්ව විද්‍යාලය, 5 වන මහල, ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, කෝට්ටේ පාර, බොරැල්ල"** යන ලිපිනයට, **2026 සැප්තැම්බර් මස 14** වන දින පස්වරු 3.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මීට අමතරව, ඉහත සඳහන් (1- 6 ) ලේඛනවල මෘදු පිටපතක් (Soft copy) සහ අනෙකුත් සහය ලේඛන PDF ආකෘතියෙන් පහත දක්වා ඇති විද්‍යුත් තැපැල් ලිපිනයට ද ඉදිරිපත් කළ යුතුය. කවරයේ ඉහළ වම් කෙළවරේ **"අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත"** ලෙස සඳහන් කිරීමට අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

අවසාන දිනට පසුව ලැබෙන හෝ ඉහත උපදෙස් වලට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී,**
**ලේකම්, කළමනාකරණ මණ්ඩලය,,**
**දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය,**
**කොළඹ විශ්වවිද්‍යාලය,**
**5 වන මහල, ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල,**
**කෝට්ටේ පාර, බොරැල්ල.**
**2026 අගෝස්තු 23**

recruitments@pgiimed.cmb.ac.lk

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED